සියලු ම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

# අවසාන වාර පරීක්ෂණය - 2020

07 ශ්‍රේණිය | ගණිතය | කාලය පැය 2 යි

නම/ විභාග අංකය :  පන්තිය :

## වැදගත්

- මෙම ප්‍රශ්න පත්‍රය පිටු 6 කින් සමන්විතය.
- නියමිත ස්ථානයේ ඔබේ නම / විභාග අංකය නිවැරදිව ලියන්න.
- I කොටසෙහි ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම සපයන්න.
- පිළිතුරු ලිවීමටත් එම පිළිතුරු ලබා ගත් ආකාරය දැක්වීමටත් එක් එක් ප්‍රශ්නය යටින් තබා ඇති ඉඩ ප්‍රමාණය ප්‍රයෝජනයට ගන්න.
- II කොටසෙහි ප්‍රශ්න හයකට පමණක් පිළිතුරු සපයන්න. ඒ සඳහා ඔබ විසින් සපයාගත් කඩදාසි යොදා ගත යුතුය
- ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී අදාල පියවර හා නිවැරදි ඒකක දැක්වීම අත්‍යාවශ්‍යය.
- පහත දක්වා ඇති පරිදි ලකුණු ප්‍රදානය කෙරේ.

I A කොටසෙහි
එක් එක් ප්‍රශ්නයකට ලකුණු 2 බැගින්

II කොටසෙහි
එක් එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින්

**පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| කොටස | ප්‍රශ්න අංකය | ලකුණු |
|---|---|---|
| I | 1-20 | |
| II | 1 | |
| | 2 | |
| | 3 | |
| | 4 | |
| | 5 | |
| | 6 | |
| | 7 | |
| එකතුව | | |

ලකුණු කළේ

ගුරුභවතාගේ නම :-

අත්සන

විශේෂ සටහන්

## I කොටස

සැ.යු. : සියළු ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(01) (-3) + (+10) සුළු කරන්න.

(02) හිස්තැන් පුරවන්න.

5.75 g = ................................ g ............................mg

(03) P = {1 සිට 15 තෙක් ඇති ත්‍රිකෝණ සංඛ්‍යා} මෙම කුලකයේ අවයව වෙන් රූපයක දක්වන්න.

(04) $0.24 = \frac{24}{\square} = \frac{\square}{25}$ හිස්තැන් පුරවන්න.

(05) මෙම බහුඅස්‍රය සවිධි බහුඅස්‍රයක් බව පියුමි පවසයි. එය සත්‍ය ද? අසත්‍ය ද? හේතු දක්වන්න.



(06) සුළු කර පිළිතුර හිස්තැන මත ලියන්න.

i) $5 + 3 \times 2 =$ ....................................

ii) $(5 + 3) \times 2 =$ ................................

(07) සමපාද ත්‍රිකෝණයක පරිමිතිය $3x$ cm වේ. එහි පැත්තක දිග සොයන්න.

(08) 423 යන සංඛ්‍යාවේ ඉලක්කම් දර්ශකය කී වෙනි සමචතුරස්‍ර සංඛ්‍යාව වේද?

(09) අගය සොයන්න.

(i) $23.75 \times 10 =$ ..........................................

ii) $23.75 \div 10 =$ ............................

(10) $2x + 7 = 13$ යන සමීකරණය විසඳා $x$ හි අගය සොයන්න.

(11) ඝනක හැඩති භාජනයක පරිමාව $27\text{cm}^3$ වේ. ඝනකයේ පැත්තක දිග සොයන්න.



(12) $\frac{3}{4}, \frac{5}{12}$ යන භාග අතුරින් විශාල භාගය තෝරා ලියන්න.

(13) මෙම පැණි බීම බෝතලයේ පැණි බීම සම්පූර්ණයෙන්ම පිරී ඇත. මධුෂ ඉන් $1l\ 150ml$ පානය කරයි. බෝතලයේ ඉතිරි බීම ප්‍රමාණය සොයන්න.




(14) a) උත්තල බහු - අස්‍රයක එක් අභ්‍යන්තර කෝණයක් පරාවර්ත කෝණයක් විය හැක.

b) අවතල බහු අස්‍රවල කුඩාම බහු අස්‍රය චතුරස්‍රය වේ.

ඉහත ප්‍රකාශ හොඳින් කියවා පහත සඳහන් පිළිතුරු අතුරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(i) (a), (b) යන දෙකම සත්‍ය වේ. (ii) (a) සත්‍ය වේ. (b) අසත්‍ය වේ.

(iii) (a) අසත්‍ය වේ. (b) සත්‍ය වේ. (iv) (a), (b) යන දෙකම අසත්‍ය වේ.

(15)




මෙම වෘත්තයේ,

i) විශ්කම්භය නම් කරන්න.

ii) එහි දිග සඳහා වීජීය ප්‍රකාශනයක් y ඇසුරින් ලියන්න.

(16) පහත දක්වා ඇත්තේ දිගින් අසමාන තහඩු කැබලි දෙකකි. එම කැබලි දෙකේ මුළු දිග කොපමණ ද?



(17) ඝන වස්තුවක දාර 8 කි. මුහුණත් ගණන 5 කි.

i) එහි ශීර්ෂ ගණන සොයන්න.

ii) ඝන වස්තුවේ නම කුමක් ද?

(18) හිස් තැනට ගැලපෙන ලෙස "✓" හෝ "X" ලකුණ යොදන්න.

ක්‍රි: ව: 1856 අයත් වන්නේ,

(i) 18 වන සියවසටය ....................

(ii) අධික වර්ෂයකි. ....................

(19) හේරත් මහත්මයාගේ මාසික ආදායමෙන් $\frac{2}{5}$ ක් දරුවන්ගේ අධ්‍යාපනය සඳහා වැය කරයි. එම මුදල ඔහුගේ මාසික ආදායමේ ප්‍රතිශතයක් ලෙස දක්වන්න.

(20) දී ඇති ආස්තරයේ,

(A) කොටසේ වර්ගඵලය = $12\ cm^2$

(i) B කොටසේ වර්ගඵලය = ......................$cm^2$

(ii) සංයුක්ත රූපයේ වර්ගඵලය = ..............$cm^3$



## II කොටස

ප්‍රශ්න 06 ට පමණක් පිළිතුරු සපයන්න.

(01) (a) i) 8 සහ 3 හි කුඩාම පොදු ගුණාකාරය සොයන්න.

ii) $3\frac{1}{8} - 1\frac{2}{3}$ සුළු කරන්න.

b) සහල් මල්ලක ස්කන්ධය 19kg 750g කි.

i) සහෝදරයන් පස්දෙනෙකු අතර මෙය සමසේ බෙදා ගත්තේ නම් එක් සහෝදරයකුට ලැබෙන සහල්වල ස්කන්ධය සොයන්න.

ii) සහල් කිලෝග්‍රෑම් 1 ක මිල රු. 85.00 නම් එක් අයෙකුට ලැබුණු සහල්වල මිල සොයන්න.

(02) i) 1 : 4 : 5 යන අනුපාතයට තුල්‍ය අනුපාතයක් ලියන්න.

ii) පෑනක මිල රු. 15.00 කි. පොතක මිල පෑනක මිල මෙන් දෙගුණයකි. පැන්සලක මිල පෑනක මිලට වඩා රු. 5.00 කින් අඩුය.
පැන්සලක මිල පෑනක මිල පොතක මිල අතර අනුපාතය සරලම ආකාරයෙන් ලියන්න.

iii) ලෝහමය ප්‍රතිමාවක් නිර්මාණය කිරීමේ දී රිදී හා තඹ මිශ්‍රකර ඇති අනුපාතය 2 : 3 වේ. ලෝහමය ප්‍රතිමාවේ ස්කන්ධය 1kg 500g වේ.

a) මෙහි ඇති රිදීවල ස්කන්ධය සොයන්න.

b) රිදී 100g මිල රු. 2500 ක් නම් ප්‍රතිමාව සෑදීම සඳහා අවශ්‍ය රිදීවල වටිනාකම සොයන්න.

(03) a) i) මෙම රූපයේ පරිමිතිය සඳහා වීජීය ප්‍රකාශනයක් ලියන්න.




ii) එම වීජීය ප්‍රකාශනය සුළු කරන්න.

iii) $x = 5\text{cm}$ වන විට ත්‍රිකෝණයේ පරිමිතිය සොයන්න.

b) මල් පාත්තියක පළල මීටර් $x$ වේ. දිග පළලට වඩා මීටර් 7 කින් වැඩිය.

i) දිග වීජීය ප්‍රකාශනයකින් දක්වන්න.

ii) මල් පාත්තියේ පරිමිතිය $4x+14$ ප්‍රකාශනයෙන් ලැබෙන බව පෙන්වන්න.

(04) i) AB = 8cm වන ලෙස රේඛා ඛණ්ඩයක් අඳින්න.

ii) එම රේඛා ඛණ්ඩයේ A කේන්ද්‍රය වූ ද අරය 4cm වූ ද වෘත්තය අඳින්න.

iii) එම රේඛා ඛණ්ඩයේ ම B කේන්ද්‍රය වූ ද අරය 5cm වූ වෘත්තය ඇඳ එම වෘත්ත දෙක ඡේදනය වන ලක්ෂ්‍ය C හා D ලෙස නම් කරන්න.

iv) $A\hat{C}B$ කෝණයේ අගය මැන ලියන්න.

v) එම ත්‍රිකෝණය,

a) පාද අනුව කුමන වර්ගයේ ත්‍රිකෝණයක් ද?

b) කෝණ අනුව කුමන වර්ගයේ ත්‍රිකෝණයක් ද?

(05) i) x හා y අක්ෂවල ධන දිශාවට ඒකක 7 ක් වූ කාටීසිය තලයක් අඳින්න.

ii) එම කාටීසිය තලයේ පහත සඳහන් ලක්ෂ්‍ය ලකුණු කර අනුපිළිවෙලට සරල රේඛා ඛණ්ඩවලින් යා කර ආරම්භක ලක්ෂ්‍යය කරා පැමිණෙන්න.

A (2, 6) B (2, 5) C (1 , 4) D (2, 1) E (4 , 1)
F (5 , 4) G (4, 5) G(4 , 6)

iii) ඔබට ලැබුණු රූපයේ ද්විපාර්ශ්වික සමමිතික අක්ෂය අඳින්න. එම අක්ෂයය දික් කර x අක්ෂය හමුවන ලක්ෂය M ලෙස නම් කරන්න.

iv) M ලක්ෂ්‍යයේ ඛණ්ඩාංකය ලියන්න.

- - www.mathspapers.info

(06) පාසලක වසර 3 ක දී අ.පො.ස (උසස් පෙළ) විභාගය සඳහා එක් එක් විෂය ධාරා සඳහා පෙනී සිටි සිසුන් ගණන පිළිබඳ විස්තරයක් පහත වගුවේ දැක්වේ.

| වර්ෂය | විද්‍යා විෂය ධාරාව | කලා විෂය ධාරාව | වාණිජ විෂය ධාරාව |
|---|---|---|---|
| 2017 | 40 | 60 | 30 |
| 2018 | ...................... | ...................... | ...................... |
| 2019 | 70 | 40 | 50 |

එම තොරතුරුවලට අදාළ අඳින ලද අසම්පූර්ණ බහු තීර ප්‍රස්තාරයක් පහත දක්වා ඇත.




i) වගුවේ තොරතුරු අනුව 2019 වර්ෂය සඳහා බහුතීර ප්‍රස්තාරය සම්පූර්ණ කරන්න.

ii) බහුතීර ප්‍රස්ථාරය අනුව 2018 වර්ෂය සඳහා වගුවේ හිස්තැන් පුරවන්න.

iii) 2018 වසරේ උසස් පෙළ විභාගය සඳහා පෙනී සිටි සිසුන් ගණන කොපමණ ද?

iv) එම වසර තුන තුළ දී විද්‍යා හා කලා විෂය ධාරාවන්ට පෙනී සිටි සිසුන් ගණන අනුව ඔබට එළඹිය හැකි නිගමනයක් ලියන්න.

(07) a) පියල් හා නඳුනි යහළුවන් දෙදෙනෙකි. පියල්ගේ උපන් දිනය 2007-01-14 වේ. නඳුනි පියල්ට වඩා අවු: 1 මාස 2 දින 20 ක් වයසින් වැඩිය. නඳුනිගේ උපන් දිනය සොයන්න.

b) සෘජුකෝණාස්‍රාකාර රැස්වීම් ශාලාවක දිග 120m හා පළල 30 m කි.

i) මෙහි පරිමාණ රූපයක් ඇඳීමට අදාල සුදුසු පරිමාණයක් ලියා දක්වන්න.

ii) එම පරිමාණයට අනුව මෙම රැස්වීම් ශාලාවේ පරිමාණ රූපයක් ඇඳ දක්වන්න.



ඔබට අවශ්‍ය සියලුම ගණිත ප්‍රශ්න පත්‍ර ( mathspapers.info ) වෙතින් පහසුවෙන්ම ලබාගන්න